# ලෝහෝර් ආර්යා ණය අරමුදල

## කළමනාකරණ සහකාර III - තනතුරු 04 සහ රියැදුරු - තනතුරු 01 පුරප්පාඩු පිරවීම

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ කළමනාකරණ සහකාර III - තනතුරු (04) සහ රියැදුරු III ශ්‍රේණිය තනතුරු (01) සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ● කළමනාකරණ සහකාර III - තනතුරු (04)

**01. අධ්‍යාපන සුදුසුකම්**

ඈ) I. සිංහල හෝ දෙමළ

II. ගණිතය

III. ඉංග්‍රීසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

ඇ) තනතුරට පැවරෙන කාර්යයන් ස්වභාවය අනුව අවශ්‍ය වන වෘත්තීය සුදුසුකම් පළපුරුද්ද ඇතුළු වෙනත් සුදුසුකම්

- සිංහල සහ ඉංග්‍රීසි යතුරුලියනය කිරීමේ මනා හැකියාව සහ පරිගණක නිපුණතාවය
- ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව.

**02. වෘත්තීය සුදුසුකම්**

I. සිංහල සහ ඉංග්‍රීසි යතුරුලියනය කිරීමේ මනා හැකියාව සහ පරිගණක නිපුණතාවය.

II. සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් පරිගණකය භාවිත කරමින් ගිණුම්, වාර්තා, දත්ත ලිපි ලේඛන සැකසීමේ හා ලබා ගැනීමේ හැකියාව සහිත පරිගණක නිපුණතාවය.

III. ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව තිබීම.

### ● රියැදුරු III ශ්‍රේණිය තනතුර (01)

**01. අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී විෂයයන් හයකින් සමත්වී තිබිය යුතුය.

**02. ශිල්පීය ප්‍රවීනතා**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. මෝටර් රථ රියැදුරන්, රියැදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම පිළිබඳව අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. මීට අමතරව ත්‍රී රෝද රථ ධාවනය කිරීමේ බලපත්‍රයක් ලබා තිබීම අත්‍යාවශ්‍ය කරුණකි.

● වයස් සීමාව

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

● වෙනත් සුදුසුකම්

සෑම අපේක්ෂකයෙක්ම.

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

● වැටුප් පරිමාණය :

MA 1.1 (ශ්‍රේණිය III)

රු. (27,910 - 10X300 - 7X350 - 4X495 - 20X660 - 48,540)

රු. 27,910 ක මූලික වැටුප් පියවරෙහි තබන අතර, රජය විසින් අනුමත අනිකුත් සියලුම දීමනා ද හිමි වේ.

PL - 3 (III ශ්‍රේණිය)

රු. (26,290 - 10X270 - 10X300 - 10X330 - 12X350 - 39,490)

රු. 26,290/- ක මූලික වැටුප් පියවරෙහි තබන අතර, රජය විසින් අනුමත අනිකුත් සියලුම දීමනා ද හිමි වේ.

**පොදු කොන්දේසි**

අපේක්ෂකයන් තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයක් මගිනි. මෙම තනතුරු ස්ථිර වන අතර, වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

සේවක අර්ථසාධක අරමුදලට සේවකයා විසින් 8% ක මුදලක් දායක කළ යුතු අතර, අරමුදල විසින් වැටුපෙන් 16% ක මුදල් බැර කරනු ලැබේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක දායක මුදල් අරමුදල විසින් ගෙවනු ලැබේ. මෙයට අමතරව වාර්ෂික ප්‍රසාද දීමනාවට හිමිකම් ලබයි.

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සිය අයදුම්පත පහත සඳහන් ලිපිනයට 2023-03-10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලේඛනවල ඡායා පිටපත්ද සමග පාලන භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල, අංක 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට එවිය යුතුය. තවද මෙම සහතික පත්වල මුල්පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී, අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.

I. උප්පැන්න සහතික පිටපත
II. අධ්‍යාපන සහතිකවල පිටපත්
III. පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්
IV. වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත්
V. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක පිටපත්
VI. අදාළ සහතික පිටපත් අමුණා නොමැති අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**පාලන භාරකාර,**
**ලෝහෝර් ආර්යා ණය අරමුදල,**
**අංක : 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ - 02.**